# ගණිතය කාර්ය පත්‍රිකාව

10 ශ්‍රේණිය ගණිතය නොවැම්බර් 4 වැනි සතිය

28 නිර්මාණ තේමාව - ජ්‍යාමිතිය

**මෙම සතිය තුල නියමිත පාඩම්වලින් ලබාගතයුතු ඉගෙණුම් පල**

- මූලික පථ හතරක් නිර්මාණය කිරීම.
- දෙනලද දත්ත ඇසුරෙන් ත්‍රිකෝණ නිර්මාණය කිරීම.
- සමාන්තර රේඛා හා ඒ අශ්‍රිත නිර්මාණය කිරීම.
- මූලික පථ හතරක් නිර්මාණය කිරීම.
- දෙනලද දත්ත ඇසුරෙන් ත්‍රිකෝණ නිර්මාණය කිරීම.
- සමාන්තර රේඛා හා ඒ අශ්‍රිත නිර්මාණය කිරීම.

**ශිෂ්‍යයා කළයුතු කාර්යයන් කෙටියෙන්**

- පෙර ඉගෙණුම් කාර්ය පත්‍රිකාවල ඇති ක්‍රියාකාරකම් සිදුකරමින් ඉගෙනගන්න.
- ස්වයං අධ්‍යයන කාරය පත්‍රිකාවේ 1, 2, 3 සහ 4 පිටු හොදින් කියවමින් ක්‍රියාකරකම් සිදු කරන්න.
- ස්වයං අධ්‍යයන කාරය පත්‍රිකාවේ පැවරුම 1 සම්පූර්ණ කරන්න.
- පෙළ පොතේ නිර්මාණ පාඩමේ 110 පිටුවේ මූලික පථ පිළිබද කොටස හොදින් අධ්‍යයනය කරන්න.
- පෙළ පොතේ නිර්මාණ පාඩමේ 115 පිටුවේ 28.1 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.
- ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකාවේ ත්‍රිකෝණ නිර්මාණය කොටස හොදින් කියවා එම නිර්මාණ කරන්න.
- ස්වයං අධ්‍යයන කාර්ය පත්‍රිකාවේ පැවරුම 2 කරන්න.
- පෙළපොතේ 117 හා 118 පිටුවල නිදසුන 1, නිදසුන 2 හා නිදසුන 3 හොඳින් අධ්‍යයනය කරන්න.
- පෙළ පොතේ 28. 2 අභ්‍යාසය 119හා 120 පිටු සම්පූර්ණ කරන්න.
- ස්වයං ඉගෙණුම් පත්‍රිකාවේ සමාන්තර රේඛා හා ඒ අශ්‍රිත නිර්මාණ කොටස කියවා එම නිර්මාණ කරන්න.
- ස්වයං ඉගෙණුම් පත්‍රිකාවේ පැවරුම 3 කරන්න.
- පෙළ පොතේ 121හා 122 පිටුවල සමාන්තර රේඛා ආශ්‍රිත නිර්මාණ කොටස හොදින් කියවන්න.
- පෙළ පොතේ 28.3 අභ්‍යාසය සම්පූර්ණ කරන්න.
- ඔබේ ඉගෙණුම් කට්ටලයේ ඇති ඒකක පරීක්ෂණය සම්පූර්ණ කරන්න.
- e තක්සලාව, e නැණ පියස, ගුරු ගෙදර, youtube නාලිකා, පාසල් ශිෂ්‍ය සමූහ (Whatsapp, Viber, …) Google class room, online ඉගෙනුම්, පාසල් වෙබ් අඩවි, පෙළ පොත හෝ මුද්‍රිත පොත් පත් ආදී ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.

**මෙම ක්‍රියාකාරකම් සදහා උපකාර කරගත හැකි ආධාරක**

- 10 ශ්‍රේණිය ගණිතය ii පෙළ පෙතේ පිටු අංක 110 සිට 123 දක්වා .
- ගණිතය පහසුවෙන් - ජ්‍යාමිතිය - ජාතික අධ්‍යාපන ආයතනය (පිටු අංක 57 හා 60)
- ගණිත ගුරයා ග්‍රන්ථය - ගණිත ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය (පිටු අංක 254 සිට 257 දක්වා )
- E - නැණ පියස වෙබ් අඩවිය
- ‘සතුටින් ගණිතය’ සබරගමු පළාත් 10 ශ්‍රේණිය *Telegram* සිසු සමූහය
  - *https://t.me/joinchat/e7B47qD7E-Q3ZDI1*
- e නැණ පියස වෙබ් අඩවිය - සබරගමු පළාත, සතුටින් ගණිතය ඉගෙනුම් ගොනුව (PDF), පෙර ඉගෙනුම් කාර්ය පත්‍රිකා/ ස්වයං අධ්‍යයන කට්ටලය/ ඒකක පරීක්ෂණය
  - https://www.enenapiyasa.lk/lms/course/view.php?id=108#section-27

  E - තක්සලාව වෙබ් අඩවිය
  - https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=537&section=31
  - ගුරු ගෙදර නාලිකාව - https://youtu.be/sG0m0U3FCPI / https://youtu.be/6-iWpFBkZsE
  - වෙනත් Youtube link - https://youtu.be/VGyAEpjgu74

# ඒකක පරීක්ෂණය

## 10 ශ්‍රේණිය   නිර්මාණ 28 පාඩම

1) AB = 6 cm වූ සරල රේඛා ඛණ්ඩයක් නිර්මාණය කරන්න. A හා B කේන්ද්‍ර ලෙස ගෙන අරය 4 cm බැගින් වූ වෘත්ත දෙකක් නිර්මාණය කරන්න.

2) PQ = 5cm වූ සරල රේඛා ඛණ්ඩයක් නිර්මාණය කරන්න. A හා B ලක්ෂ්‍ය දෙකට සමදුරින්වන ලක්ෂ්‍යන්ගේ පථය නිර්මාණය කරන්න.

3) 5cm දිග සරල රේඛා ඛණ්ඩයක් අදින්න. එම සරල රේඛා ඛණ්ඩයේ සිට 3 cm දුරින් පිහිටි ලක්ෂ්‍යවල පථය නිර්මාණය කරන්න.

4) ලම්බ සමච්ඡේදකය නිර්මාණය පිළිබඳ දැනුම භාවිතයෙන් 9.5 cm දිග සරල රේඛාවක් සමාන කොටස් 4කට බෙදන්න.

5) AB = 7cm, BC=5cm, AC = 6cm වන ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

6) PQ = 8cm, R$\hat{P}$Q = $45^0$, P$\hat{Q}$R = $75^0$, වන PQR ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

7) AB = 7 cm , A$\hat{B}$C = $60^0$, BC = 5.5 cm වන ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

8) (i) XY = 6.5, YZ = ZX = 5cm වන සමද්විපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.
   (ii) X හරහා ZYට සමාන්තර රේඛාවක් නිර්මාණය කරන්න.

9) (i) පාදයක දිග 5cm වන ABC සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.
   (ii) එම ත්‍රිකෝණයේ AC ආධාරකය කර ගනිමින් නැවතත් ACX සමපාද ත්‍රිකෝණයක් AC වලින් අනෙක් පස නිර්මාණය කරන්න.
   (iii) AXCB කුමන වර්ගයේ චතුරස්‍රයක් දැයි හේතු සහිතව දක්වන්න.
   (iv) AX හා BC පාද ගැන ඔබට කිව හැකි විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

10) (i) PQ = 6 cm සරල රේඛා ඛණ්ඩයක් නිර්මාණය කරන්න.
   (ii) P$\hat{Q}$R = $120^0$ කෝණය නිර්මාණයකර QR= 7 cm වන පරිදි R ලක්ෂය පිහිටුවන්න.
   (iii) Q හා R වලට සමදුරින් පිහිටි ලක්ෂ්‍යයන්ගේ පථය නිර්මාණය කර එය දික්කල PQ හමුවන ලක්ෂ්‍යය S ලෙස නම්කරන්න.
   (iv) PQ ට සමාන්තරව R හරහා රේඛාවක් නිර්මාණය කර එය ඉහත (iii) හි ඇදි පථය හමුවන ලක්ෂ්‍යය T ලෙස නම්කරන්න.

දසුන් තෙන්නකෝන් - උඩුව ශ්‍රී සද්ධානන්ද ම වි - බුලත්කොහුපිටිය.